ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ ප්‍රථම වටමේස සාකච්ඡාව**

**අනාගතයට සූදානම් ඉන්දු - ලංකා හවුල්කාරිත්වයක්: පොදු අනාගතයක් සඳහා සංවාදයක්**

ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය (SLIPFA) කොළඹ, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ දැනුම් සහකරුවකු වශයෙන් පැක්ටම් ආයතනය ද හා එක්ව පෙබරවාරි 5 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී වටමේස සාකච්ඡාවක් පවත්වන ලදි. මෙම වටමේස සාකච්ඡාව "අනාගතයට සූදානම් ඉන්දු - ලංකා හවුල්කාරිත්වයක්: පොදු අනාගතයක් සඳහා සංවාදයක්" යන තේමාව යටතේ පැවැත්විණ.

2. මෙහි මූලසුන SLIPFA සභාපති සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා සහ වැඩබලන ඉන්දීය මහ කොමසාරිස් (වෛද්‍ය) සත්‍යාංජල් පාණ්ඩේ මැතිතුමා විසින් හොබවන ලදි. SLIPFA ලේකම් ගරු (වෛද්‍ය) කාවින්ද ජයවර්ධන මැතිතුමා සහ උප සභාපතිවරුන් වන ගරු පී.පී. පොන්නම්බලම් සහ ගරු රවි කරුණානායක, උප ලේකම්වරුන් වන ගරු සිවඥානම් ශ්‍රීදරන් සහ ගරු අනුෂ්කා තිලකරත්න සහ භාණ්ඩාගාරික සහ වැවිලි සහ ප්‍රජා යටිතලපහසුකම් නියෝජ්‍ය අමාත්‍ය සුන්දරලිංගම් ප්‍රදීප් යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

3. මෙය මෙවන් ආකාරයේ පළමු මුලපිරීම වූ අතර එයට සැසි දෙකක් ඇතුළත් විය. පළමු සැසියේදී බලශක්ති සහයෝගීතාවය පිළිබඳව සාකච්ඡා කරන ලද අතර දෙවන සැසියේදී සමුද්‍රීය සහයෝගීතාවය පිළිබඳව සාකච්ඡා කරන ලදි. මෙම සැසි ද්විත්වයට ඉන්දීය සහ ශ්‍රී ලංකා ප්‍රවීණයන් විසින් සිදු කළ ඉදිරිපත් කිරීම් ද ඇතුළත් විය.

4. SLIPFA හි සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පනහකට ආසන්න පිරිසක් සංවාදය සඳහා එක් වූ අතර වටමේස සාකච්ඡාවේ අරමුණ වූයේ විවිධ පක්ෂවල මන්ත්‍රීවරුන්ට එක්ව නියැළීම සඳහා වේදිකාවක් සකසා දීම සහ ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වයේ වැදගත් අංශ තුළ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායි සහයෝගීතාවය සඳහා නව්‍ය මාර්ග සොයා බැලීම යි.

***

***කොළඹ***
***2026 පෙබරවාරි 06***